මගේඅංකය:-EST-7/TPORT/05/1014
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.06.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධරයන් / පළාත් රාජ්‍ය නිලධරයන් / අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්

මහජන සේවාවන් කාර්යක්ෂමව, අනලස්ව හා අප්‍රමාදව ඉටුකිරීම සඳහා රජයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයන්ට නිල ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මේ දක්වා නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි 2014.01.01 දින සිට මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබේ.

## 02. නිල වාහන අනුයුක්ත කරනු ලැබීමට අවසර ඇති නිලධරයන් පහත පරිදි වේ.

පහත 2:1 වගුවේ 1 තීරුවේ සඳහන් නිලධරයන්ට රාජකාරී කටයුතු සඳහා සහ ඒ වෙනුවෙන් කාර්යාලය හා නිවාසය දක්වා යාම් ඊම් සඳහා නිල වාහනයක් යොදාගත හැකිය. නිවස හා කාර්යාලය අතර උපරිම දුර සීමාව කිලෝමීටර් 50 නොඉක්මවිය යුතුය. අනුමත මාසික ගාස්තු ගෙවීමේ පදනම මත පෞද්ගලික ගමන් සඳහා නිල වාහන පාවිච්චි කිරීමට පහත වගුවේ **"හිමිකම ඇත"** යනුවෙන් සඳහන් නිලධරයන්ට පමණක් කිලෝමීටර් 50ක දුර සීමාව අදාළ නොවේ.

2:1

| | නිල වාහන අනුයුක්ත කරනු ලැබීමට අවසර දෙනු ලබන නිලධරයන් | අනුයුක්ත කරනු ලැබූ වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා යොදාගැනීමට හිමිකම ලබන්නේ ද යන වග |
|---|---|---|
| | **රාජ්‍ය සේවයේ තනතුරු** | |
| I. | ජනාධිපති ලේකම් | **හිමිකම ඇත** |
| II. | අග්‍රාමාත්‍ය ලේකම් | **හිමිකම ඇත** |
| III. | අමාත්‍ය මණ්ඩල ලේකම් | **හිමිකම ඇත** |
| IV. | කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශයක ලේකම් | **හිමිකම ඇත** |

| | | |
|---|---|---|
| V. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | **හිමිකම ඇත** |
| VI. | මැතිවරණ කොමසාරිස් | **හිමිකම ඇත** |
| VII. | විගණකාධිපති | **හිමිකම ඇත** |
| VIII. | ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>අධිකරණ සේවා කොමිෂන් සභාව<br>ජාතික පොලිස් කොමිෂන් සභාව | **හිමිකම ඇත** |
| IX. | අතිරේක ලේකම් -<br>(අ) ජනාධිපති කාර්යාලය<br>(ආ) අග්‍රාමාත්‍ය කාර්යාලය<br>(ඉ) අමාත්‍ය මණ්ඩල කාර්යාලය<br>(ඊ) කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශ<br>(උ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව | **හිමිකම ඇත** |
| X. | දිසාපති/ දිස්ත්‍රික් ලේකම් | **හිමිකම ඇත** |
| XI. | කැබිනට්/කැබිනට් නොවන අමාත්‍යාංශයක් යටතට ගැනෙන හා ඒ යටතට නොගැනෙන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ,<br>(අ) අධ්‍යක්ෂ ජනරාල්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>(ආ) කොමසාරිස් ජනරාල්/ අතිරේක කොමසාරිස් ජනරාල්/ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්<br>(ඉ) දුම්රිය සාමාන්‍යාධිකාරි<br>(ඊ) නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු<br>(උ) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/ පළාත් සර්වේයර් ජනරාල්<br>(ඌ) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති | **හිමිකම ඇත** |
| XII. | SL 1 - 2006 හි 1 පන්තියට අදාල හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක සිටින ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ, පාලක හා කොමසාරිස් වැනි තනතුරු දරන නිලධරයන් | **හිමිකම ඇත** |
| XIII. | අතිරේක දිස්ත්‍රික් ලේකම් | **හිමිකම ඇත** |
| XIV. | ප්‍රාදේශීය ලේකම් | **හිමිකම ඇත** |
| XV. | ලේකම්, සමූපකාර සේවා කොමිෂන් සභාව | **හිමිකම ඇත** |
| XVI. | කම්කරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක | **හිමිකම ඇත** |
| XVII. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි විධිවිධාන අනුව SL 1 - 2006 වැටුප් පරිමාණය හිමි, දීපව්‍යාප්ත සේවාවක හෝ දෙපාර්තමේන්තුගත සේවාවක 1 පන්තියේ ස්ථිර තනතුරක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති තනතුරකට ස්ථිර පදනමින් පත් කරන ලද අදාල දීප ව්‍යාප්ත සේවයේ හෝ දෙපාර්තමේන්තුගත සේවයේ 1 පන්තියේ නිලධරයකු | **හිමිකම ඇත** |
| XVIII. | ජනාධිපති විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති වෙනත් විශේෂිත තනතුරු දරන SL 1 - 2006 වැටුප් පරිමාණයේ 1 පන්තියට අදාළ ආරම්භක වැටුප හෝ ඊට ඉහළ වැටුපක් හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක්/ ස්ථාවර වැටුපක් දරන නිලධරයන් | **හිමිකම නැත** |
| | **අධිකරණ නිලධරයන්** | |
| I. | අග්‍රවිනිශ්චයකාරවරයා | **හිමිකම ඇත** |
| II. | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු | **හිමිකම ඇත** |
| III. | අභියාචනාධිකරණයේ සභාපතිවරයා | **හිමිකම ඇත** |
| IV. | අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු | **හිමිකම ඇත** |
| V. | මහාධිකරණ විනිශ්චයකාරවරු | **හිමිකම ඇත** |

| | | |
|---|---|---|
| VI. | දිස්ත්‍රික් විනිශ්චයකාරවරු | **හිමිකම ඇත** |
| VII. | මහේස්ත්‍රාත්වරු | **හිමිකම ඇත** |
| VIII. | කම්කරු විනිශ්චය සභා සභාපතිවරු | **හිමිකම ඇත** |
| IX. | ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරු | **හිමිකම ඇත** |
| X. | කම්කරු වන්දි කොමසාරිස් | **හිමිකම ඇත** |
| XI. | අතිරේක කම්කරු වන්දි කොමසාරිස් | **හිමිකම ඇත** |
| XII. | නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් | **හිමිකම ඇත** |
| | **නීති නිලධරයන්** | |
| I. | නීතිපති | **හිමිකම ඇත** |
| II. | සොලිසිටර් ජනරාල් | **හිමිකම ඇත** |
| III. | අතිරේක සොලිසිටර් ජනරාල් | **හිමිකම ඇත** |
| IV. | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | **හිමිකම ඇත** |
| V. | ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ/ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | **හිමිකම ඇත** |
| VI. | රජයේ නීතිඥ/ රජයේ අධිනීතිඥ | **හිමිකම ඇත** |
| VII. | නීති කෙටුම්පත් සම්පාදක | **හිමිකම ඇත** |
| VIII. | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | **හිමිකම ඇත** |
| IX. | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | **හිමිකම ඇත** |
| X. | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | **හිමිකම ඇත** |
| XI. | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | **හිමිකම ඇත** |
| XII. | අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ ජනරාල් - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | **හිමිකම ඇත** |
| | **ත්‍රිවිධ හමුදා නිලධරයන්** | |
| I. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බ්‍රිගේඩියර් නිලය උසුලන නිලධරයන් හා ඊට ඉහළ නිලධරයන් | **හිමිකම ඇත** |
| II. | ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර කොමදෝරු නිලය උසුලන නිලධරයන් හා ඊට ඉහළ නිලධරයන් | **හිමිකම ඇත** |
| III. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්ථිර ගුවන් කොමදෝරු නිලය උසුලන නිලධරයන් හා ඊට ඉහළ නිලධරයන් | **හිමිකම ඇත** |
| | **පොලිස් නිලධරයන්** | |
| I. | පොලිස්පති | **හිමිකම ඇත** |
| II. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | **හිමිකම ඇත** |
| III. | නියෝජ්‍ය පොලිස්පති | **හිමිකම ඇත** |
| IV. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි | **හිමිකම නැත** |
| V. | පොලිස් අධිකාරි | **හිමිකම නැත** |
| VI. | සහකාර පොලිස් අධිකාරි | **හිමිකම නැත** |

| රජයේ වෛද්‍ය නිලධරයන් | |
|---|---|
| I. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | හිමිකම ඇත |
| II. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික රෝහල | හිමිකම ඇත |
| III. අධ්‍යක්ෂ, විශේෂිත මහජන සෞඛ්‍ය ආයතන | හිමිකම ඇත |
| IV. අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල් | හිමිකම ඇත |
| V. අධ්‍යක්ෂ, පළාත් මහ රෝහල් | හිමිකම ඇත |
| VI. අධ්‍යක්ෂ , විශේෂිත තෘතියික මට්ටමේ රෝහල් හා ආයතන | හිමිකම ඇත |
| VII. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | හිමිකම ඇත |
| VIII ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | හිමිකම ඇත |
| IX අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යාංශය (SL 2 - 2006 වැටුප් පරිමාණයේ 1 පන්තියට අදාළ රු.37,495/= ක් හෝ ඊට ඉහළ වැටුප් තලයක් දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ තනතුර දරන වෛද්‍ය නිලධරයන්) | හිමිකම ඇත |
| X විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධරයන් | හිමිකම ඇත |
| **පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්** | |
| I. පළාත් ප්‍රධාන ලේකම් | හිමිකම ඇත |
| II. පළාත් ආණ්ඩුකාරවර ලේකම් | හිමිකම ඇත |
| III. පළාත් අමාත්‍යාංශයක ලේකම් | හිමිකම ඇත |
| IV. පළාත් සභාවක සභා ලේකම් | හිමිකම ඇත |
| V. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක ලේකම් | හිමිකම ඇත |
| VI. පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | හිමිකම ඇත |
| VII. පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර දරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධරයන් | හිමිකම ඇත |
| VIII. පළාත් අමාත්‍යාංශ යටතේ ඇති පළාත් දෙපාර්තමේන්තුවල SL 1 - 2006 හි 1 පන්තියට අදාළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක් දරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් | හිමිකම ඇත |
| IX. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි විධිවිධාන අනුව SL 1 - 2006 වැටුප් පරිමාණය හිමි, දීපව්‍යාප්ත සේවාවක හෝ දෙපාර්තමේන්තුගත සේවාවක 1 පන්තියේ ස්ථිර තනතුරක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති තනතුරකට ස්ථිර පදනමින් පත් කරන ලද අදාල දීප ව්‍යාප්ත සේවයේ හෝ දෙපාර්තමේන්තුගත සේවයේ 1 පන්තියේ නිලධරයකු | හිමිකම ඇත |
| x. මහ නගර සභාවල නාගරික කොමසාරිස් | හිමිකම ඇත |
| **අමාත්‍යවරුන්ගේ (කැබිනට්/ කැබිනට් නොවන) නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සහ වෙනත් කාර්ය මණ්ඩල** | |
| I. කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යවරයකුගේ පෞද්ගලික ලේකම් | හිමිකම ඇත |
| II. නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ පෞද්ගලික ලේකම් | හිමිකම නැත |
| III. සම්බන්ධීකරණ ලේකම් | හිමිකම නැත |
| IV. මහජන සම්බන්ධතා නිලධාරී | හිමිකම නැත |
| V. කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශයක ලේකම්වරයෙකුගේ සම්බන්ධීකරණ ලේකම් | හිමිකම නැත |

2:2 ඉහත 2:1 වගුවේ පරිදි අනුයුක්ත කරනු ලැබූ වාහන පෞද්ගලික පාවිච්චිය සඳහා යොදා ගැනීමට හිමිකම ඇති SL 3 - 2006 වැටුප් පරිමාණය හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි නිලධරයන් රු.1500/= ක් ද, අනෙක් නිලධරයන් රු.1000/= ක් ද මාසිකව රජයට ගෙවිය යුතුය.

## 03. ඉහත 2:1 වගුවෙන් ආවරණය නොවන නිලධරයන් පිළිබඳ විධිවිධාන පහත පරිදි වේ.

3:1 ඉහත 2:1 වගුවෙන් ආවරණය නොවන නමුත් රාජකාරී කටයුතු සඳහා සහ කිලෝමීටර් 50 (යාම් ඊම් කි.මී. 100) දුර සීමාව තුළ කාර්යාලය හා නිවස අතර යාම් ඊම් සඳහා පමණක් නිල වාහනයක් යොදා ගැනීමට සියලු අතින්ම සුදුසුකම් ලබන නිලධරයන් වේ නම් ඔවුන් පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකව ලබා දෙන නිර්දේශ පදනම් කරගෙන ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා මෙම චක්‍රලේඛයේ **ඇමුණුම - 01** ආකෘතියට අනුව සකස් කර අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් පෞද්ගලිකවම කරනු ලබන නිර්දේශය සහිතව රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

3:2 ඉහත 3:1 යටතේ ලැබෙන නාම යෝජනා පහත 3:4 ඡේදයේ සඳහන් නිලධරයන්ගෙන් සමන්විත නාම යෝජනා කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර කමිටුව විසින් එම ඉල්ලීම් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව කමිටු තීරණය අදාළ ලේකම්වරුන් වෙත දන්වනු ඇත.

3:3 ඉහත 2:1 වගුවේ නිල වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා හිමිකම නොලබන නිලධරයෙකු වේ නම් ඔහු පිළිබඳ නාම යෝජනාව, **ඇමුණුම - 01** ආකෘතියට අනුකූලව සකස් කර දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික නිර්දේශය සහිතව රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

3:4 ඉහත 3:3 යටතේ ලැබෙන නාම යෝජනා පහත සඳහන් නිලධරයන්ගෙන් සමන්විත නාම යෝජනා කමිටුවට ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම් කමිටුව විසින් පරීක්ෂා කර බලා, මෙම චක්‍රලේඛයට ඇතුළත් කළ යුතු යැයි නිර්දේශ කරන නාම යෝජනා වෙතොත් ඒ පිළිබඳ කමිටු තීරණය රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත පමණක් එවැනි නිලධරයෙකු ද නිල වාහනයක් පෞද්ගලික ගමන් සඳහා පාවිච්චි කිරීමට ඉහත 2:1 වගුවේ 02 තීරුව යටතේ හිමිකම ඇති අයෙකු වශයෙන් සලකනු ලැබේ.

- රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් - සභාපති
- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් - සාමාජික
- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් - සාමාජික
- රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් - සාමාජික
- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් - සාමාජික
- ආයතන අධ්‍යක්ෂ ජනරාල් - සාමාජික/කැඳවුම්කරු

## 04 නියෝජ්‍ය මට්ටමේ තනතුරු දරන රාජ්‍ය නිලධරයන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම පහත පරිදි වේ.

ආයතනය සතුව ඇති වාහන ප්‍රමාණය සහ වාහන සඳහා අනුමත වාර්ෂික ඉන්ධන ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන සේවයේ අවශ්‍යතාව මත කාර්යාලය හා නිවස ආසන්න ස්ථාන අතර යාම් ඊම් සඳහා **කණ්ඩායම් ප්‍රවාහන** පහසුකම් ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි පහත සඳහන් අයට ලබා දීමට හැකිය. මෙහි දී ගමන් ස්ථාන දෙක අතර උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 (යාම් ඊම් කි.මී. 100) නොඉක්මවිය යුතුය. එවැනි වාහනයක් රාත්‍රී කාලයේ දී නවතා තැබිය යුතු ස්ථානය ආයතන ප්‍රධානියා විසින් නියම කළ යුතු ය.

4:1 කැබිනට් හෝ කැබිනට් නොවන අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය කොමසාරිස්, නියෝජ්‍ය පාලක හෝ ඒ හා සමාන තනතුරු දරන, කිසියම් දීප ව්‍යාප්ත සේවයක I හෝ II පන්තියට අයත් හෝ ඊට සමාන මට්ටමේ වෙනත් දෙපාර්තමේන්තුගත සේවාවන්හි නිලධරයන්.

4:2 පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලවල, පළාත් අමාත්‍යාංශවල හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය මට්ටමේ තනතුරු දරන දීප ව්‍යාප්ත සේවයක I හෝ II පන්තියට අයත් හෝ ඊට සමාන මට්ටමේ වෙනත් දෙපාර්තමේන්තුගත සේවාවන්හි නිලධරයන්.

## 05. පොදු විධිවිධාන

5:1 පෞද්ගලික ගමන් සඳහා ද නිල වාහනයක් පාවිච්චි කිරීමට අවසර දී ඇත්තා වූ නිලධරයෙකුට අදාළ ගණයේ වාහනයක් පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ඇත්නම් පෞද්ගලික ගමන් සඳහා වාහනය පැදවීමට **නිලධරයා විසින් ඉල්ලා සිටියහොත්** ඒ සඳහා අවසර දීමට ආයතන ප්‍රධානියාට හැකි අතර, නිලධරයාගේ කැමැත්ත පරිදි නිල ගමන් සඳහා ද එම අවසරය දීර්ඝ කළ හැකි ය.

5:2 පෞද්ගලික ගමන් සඳහා අවසර දී ඇති නිල වාහන අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන මගින් ගෙවනු ලබන සර්වග්‍රාහී ආරක්ෂණ සහතික ඔප්පුවක් මගින් ආවරණය විය යුතු ය.

5:3 පෞද්ගලික ගමන් සඳහා නිල වාහනයක් වෙන් කර දී ඇති නිලධරයෙකුට එම වාහනය තම නිවසේ නතර කර තබා ගැනීමට හැකි ය.

5:4 නිල වාහනය සඳහා සපයනු ලබන ඉන්ධන සීමාවන් රජය විසින් වරින් වර පනවනු ලබන විධිවිධානවලට අනුකූල විය යුතු ය.

## 06. විශ්‍රාම යන අවස්ථාවේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම ඇති නිලධරයන්

**6:1** විශ්‍රාම යන අවස්ථාවේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලැබීමට පහත සඳහන් සුදුසුකම් සපුරන හා මෙම චක්‍රලේඛයේ 07 උප වගන්තිය යටතේ ඒ සඳහා නුසුදුස්සෙකු නොවන, ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධරයෙකුට ජීවිත කාලය තුළ එක්වරක් පමණක් තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගත හැකි ය.

**6:2** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි සඳහන් SL 1 - 2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් සහිත තනතුරකට ස්ථිරව පත්කළ නිලධරයෙකු වීම හා ඉහත 2:1 වගුවේ 2 තීරුවේ අනුයුක්ත කළ නිල වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා හිමිකම ඇති තනතුරක හෝ තනතුරුවල අවම වශයෙන් වසර 03ක කාල පරිච්ඡේදයක් ස්ථිර පදනමක් මත සක්‍රීයව සේවය කර තිබීම.

**6:3** එසේ වුව ද, නිලධරයා විශ්‍රාම යන අවස්ථාවේ දැරූ තනතුරේ පත්වීම, වැඩ බැලීමේ පදනම මත හෝ රාජකාරි ඉටු කිරීමේ පදනම මත හෝ වුව ද නිලධරයා ඊට පූර්වාසන්නව මෙම වරප්‍රසාදය හිමි ඉහත 2:1 වගුවේ 2 තීරුවේ පරිදි අනුයුක්ත කළ නිල වාහනය පෞද්ගලික පාවිච්චිය සඳහා හිමිකම ඇති පහළ තනතුරක සේවය කර ඇත්නම් සහ අනෙකුත් සුදුසුකම් සපුරාලන්නේ නම් නිලධරයාගේ පූර්ව තනතුරේ සේවා කාලය සහ වැඩ බලන/ රාජකාරි ඉටු කරන තනතුරේ සේවා කාලය ද ඒකාබද්ධ කරමින් එම සම්පූර්ණ සේවා කාලය සලකා නිලධරයා විශ්‍රාම යන අවස්ථාවේ දී මෙම චක්‍රලේඛය යටතේ ලැබෙන වරප්‍රසාද සඳහා හිමිකම ලබයි.

**6:4** නිලධරයෙකුට විශ්‍රාම යන අවස්ථාවේ දී මෙම තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැක්කේ තම හිමිකමට අදාළ වන පරිදි, වෛකල්පික විශ්‍රාම යාමේ වයසට එළඹීමෙන් පසු විශ්‍රාම යන විට හෝ අනිවාර්ය විශ්‍රාම යාමට අදාළව තම ලියකියවිලි ඉදිරිපත් කරන අවස්ථාවේදී ය.

**6:5** එසේ වුව ද, රජයේ තීරණයක් මත යම් දෙපාර්තමේන්තුවක් ප්‍රතිව්‍යුහගත කිරීම/ වසා දැමීම හෝ තනතුරක් අහෝසි කිරීම හෝ වැනි තමාට පාලනය කරගත නොහැකි හේතූන් මත වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැනීමට සිදු වුවහොත්, ඉහත 6:1 හා 6:2 හි සුදුසුකම් හා පහත සඳහන් කරුණු සපුරාලන්නේ නම් තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට නිලධරයෙකුට අයදුම් කළ හැකි ය.

**6:5:1** රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක විකල්ප රැකියාවක් සඳහා රජය විසින් ඉඩ සලසා නොතිබීම.

**6:5:2** පිරිනැමූ එවැනි රැකියාවක් නිලධරයා විසින් ප්‍රතික්ෂේප කර නොතිබීම.

**6:6** සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MA/MS/F/13/2008 හා 2008.05.06 දිනැති චක්‍රලේඛය පරිදි ප්‍රවාහන හා පැමිණීමේ දීමනාවකට හිමිකම් ඇති රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු හෝ I ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු/ I ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු පහත සඳහන් සුදුසුකම් සපුරා ඇත්නම් අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීමෙන් පසු විශ්‍රාම ලබන අවස්ථාවේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබාගත හැකි ය.

**6:6:1** රජයේ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු වශයෙන් වසර 25ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම සක්‍රීය සේවා කාලය තුළ රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

**6:6:2** ඉහත 6:6:1 හි සඳහන් වසර 25ක සක්‍රීය සේවා කාලය තුළ I ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු/ I ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**6:7** දීප ව්‍යාප්ත සේවාවක හෝ ඒ හා සමාන මට්ටමේ වෙනත් දෙපාර්තමේන්තුගත තනතුරක I ශ්‍රේණියේ නිලධරයෙකු ලෙස පහත සඳහන් සුදුසුකම් සපුරා ඇත්නම් අනිවාර්ය විශ්‍රාම යාමේ වයසට එළඹීමෙන් පසු විශ්‍රාම ලබන අවස්ථාවේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගත හැකි ය.

**6:7:1** SL 1 - 2006 වැටුප් පරිමාණය හා ඊට පෙර ඒ හා සමාන වැටුප් පරිමාණයක් නියම කර තිබූ දීප ව්‍යාප්ත සේවාවක වසර 25ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම සේවා කාලය තුළ වසර 10ක් I ශ්‍රේණියේ නිලධරයෙකු ලෙස සේවය කර තිබීම.

**6:7:2** SL 1 - 2006 වැටුප් පරිමාණය හා ඊට පෙර ඒ හා සමාන වැටුප් පරිමාණයක් නියම කර තිබූ සේවයක හෝ දෙපාර්තමේන්තුගත තනතුරක වසර 25ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම සේවා කාලය තුළ වසර 10 ක් I ශ්‍රේණියේ නිලධරයෙකු ලෙස සේවය කර තිබීම.

**සටහන :-**

**"සක්‍රීය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූති නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

**6:8** ඉහත 6:1 සිට 6:7 දක්වා කරුණු යටතේ "විශ්‍රාම යාමේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති නිලධරයෙකු" විශ්‍රාම යාමට පෙර මියගියහොත් එසේ මියගිය අවස්ථාවේ දී හිමිකම ලබා තිබුනේ නම්, එම නිලධරයාගේ හිමිකම කලත්‍රයාට ලබා දිය හැකි ය.

**6:9 විශේෂ විධිවිධාන**

**6:9:1** අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වැනි තනතුරු සඳහා විශේෂ අවස්ථාවල දී රාජ්‍ය සේවයෙන් පරිබාහිරව පත්කරනු ලබන පුද්ගලයන් සිය ධූරවලින් ඉවත්වීමේ දී, වසර 03කට නොඅඩු කාලයක් අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වැනි තනතුරු දරා ඇත්නම් හා පූර්වාසන්න වසර 05 ඇතුළත කිසියම් සහනදායී යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ආනයනය කර නොමැත්තේ නම් එවැනි නිලධරයන්ට තීරුබදු සහන සහිත මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබාදිය හැකි ය.

**6:9:2** විශ්‍රාම ලබන අවස්ථාවේ ලබා දෙන තීරුබදු සහන සහිත මෝටර් රථ ආනයන බලපත්‍රය සඳහා හිමිකම ලැබූ එහෙත් ඒ යටතේ බලපත්‍රයක් ලබාගෙන නොමැති කිසියම් නිලධරයෙකු විශ්‍රාම ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානී වැනි තනතුරක් දරන්නේ නම් එවැනි නිලධරයෙකුට ද ඉහත 6:9:1 හි සහනය ලබාදිය හැකි ය.

## 07. විශ්‍රාම යන අවස්ථාවේ දී තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොලබන නිලධරයන් පහත පරිදි වේ.

**7:1** විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 (1) වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ නිලධරයෙකු.

**7:2** රාජ්‍ය පරිපාලන/ විදේශ කටයුතු/ භාණ්ඩාගාර චක්‍රලේඛ යටතේ තීරුබදු අනුග්‍රහය මත වාහනයක් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කළ දිනය හෝ දේශීයව මිල දී ගනු ලැබූ මෝටර් රථ සඳහා එකී පළමු ගෙවීම සිදුකළ දිනයේ සිට විශ්‍රාම ගන්නා දිනය වන විට අවුරුදු 05ක් ඉක්මවා නොමැති නිලධරයෙකු.

**7:3** කිසියම් අනුග්‍රාහාත්මක චක්‍රලේඛ විධිවිධාන යටතේ වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර සිය කැමැත්තෙන් විශ්‍රාම ගන්නා නිලධරයෙකු.

## 08. ඉහත 06 ඡේදය යටතේ සුදුසුකම් ලබන නිලධරයන්ට පහත පරිදි තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගත හැකි ය.

**8:1** වාහනයක් ආනයනය කිරීමේ දී මි.ර.ගැ. වටිනාකම නිලධරයන් දරන තනතුරු අනුව මෙහි **ඇමුණුම 02** හි දක්වා ඇති පරිදි කාණ්ඩ 03ක් යටතේ වර්ග කරනු ලබන අතර සිලින්ඩර ධාරිතාව පිළිබඳ උපරිම සීමාවක් අදාළ නොවේ.

**8:2** ඉහත 8:1 හි සඳහන් එක් එක් කාණ්ඩයන් සඳහා පහත සඳහන් පිරිවිතරයන්ට යටත්ව අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍ර නිකුත් කළ යුතු ය.

| **නිලධරයා අයත්වන කාණ්ඩය** | **මි.ර.ගැ. වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්)** | **මෝටර් රථයේ ඉන්ධන වර්ගය** |
|---|---|---|
| I | 30,000 | පෙට්‍රල් හෝ ඩීසල් |
| II | 27,500 | පෙට්‍රල් හෝ ඩීසල් |
| III | 25,000 | පෙට්‍රල් හෝ ඩීසල් |

**8:3** ආනයනය/ මිල දී ගැනීම කරනු ලබන මෝටර් රථය සඳහා එහි එකතු කළ අගය මත බද්ද (VAT), වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) හා ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) ද ඇතුළුව ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණය මි.ර.ගැ. වටිනාකමින් (රේගු වටිනාකමින්) 45% ක් වන සේ ගැලපිය යුතු ය.

**8:4** ආනයනය කරනු ලබන මෝටර් රථයේ අනුමත මි.ර.ගැ වටිනාකම, සහන බදු සහිතව ඇ.එ.ජ. ඩොලර් 5,000ක් දක්වා පමණක් ඉක්මවා යා හැකි අතර, එසේ ඉක්මවා යන ඇ.එ.ජ. ඩොලර් 5,000 සඳහා බදු සහන ප්‍රමාණයට අමතරව ආනයන තීරුබද්ද ද නිලධරයා විසින් ගෙවිය යුතු ය.

**8:5** වාහන ආනයන බලපත්‍රයක වටිනාකම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ගණනය කිරීම නිලධරයා විසින් ණයවර ලිපි විවෘත කිරීමේ දිනට අදාළ ඇමරිකානු ඩොලරයේ වටිනාකම මත කළ යුතු ය.

**09.** ඉහත 06 වගන්තිය යටතේ තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන නිලධරයෙකු මෙහි **ඇමුණුම - 03** පරිදි අයදුම්පත්‍රයක් සකස් කර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව මහා භාණ්ඩාගාරයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

**10.** මේ විෂයය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1984.08.15 දිනැති අංක 264, 1988.02.11 දිනැති අංක 6/88, 1994.02.07 දිනැති අංක 8/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 1993.10.01 දිනැති අංක 24/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වැනි කොටසෙහි විධිවිධාන 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 මගින් අවලංගු විය. එම තීරණයේ වෙනසක් නොමැතිව 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා ඉන් අනතුරුව ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද සියලු චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2012 ද මෙයින් අවලංගු කෙරේ.

**11.** රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධරයන්ට නිල ප්‍රවාහන පහසුකම් සැලසීම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධාන අනුව කළ යුතු ය.

**12.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 01

# අංක 16/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ

## 3:1 හා 3:3 උප ඡේද යටතේ නාම යෝජනාව

01. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :- ...................................................................................

02. යෝජිත නිලධරයාගේ නම :- ...................................................................................

03. (අ) තනතුර :- ..................................................... (ආ) තනතුරට පත් වූ දිනය :- ..............................

04. (අ) තනතුරෙහි වැටුප් පරිමාණය :- ...................................................................................

(ආ) තනතුරෙහි වැටුප් කේත අංකය :- ...................................................................................

05. (අ) කාර්යාලයේ ලිපිනය :- ...................................................................................

(ආ) පෞද්ගලික ලිපිනය :- ...................................................................................

(ඉ) කාර්යාලය සහ නිවස අතර දුර :- කි.මී ...................................................................................

06. නිලධරයාගේ ආසන්නතම අධීක්ෂණ නිලධරයාගේ තනතුරු නාමය :- ................................................

...................................................................................................................................................

07. පැවරී ඇති රාජකාරි පිළිබඳ විස්තර :...................................................................................

...................................................................................................................................................

08. නිලධරයාගේ අධීක්ෂණය යටතේ සිටින නිලධරයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් :-............................

...................................................................................................................................................

09. නිලධරයාගේ පාලනය යටතේ පවත්නා විශේෂ ව්‍යාපෘති සහ වැය ශීර්ෂ ප්‍රතිපාදන තොරතුරු :- .............

...................................................................................................................................................

10. නිලධරයාට පැවරී ඇති ක්ෂේත්‍ර රාජකාරි, ගමන් කළ යුතු ස්ථාන හා මේ සඳහා දිනපතා ගමන් කළ යුතු ද යන වග :- ...................................................................................

11. මේ සඳහා පොදු ප්‍රවාහන පහසුකම් යොදා නොගැනීමට හේතු :- ..........................................................

...................................................................................................................................................

12. අදාළ දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ දැනටමත් මෙම පහසුකම් ලබා ඇති නිලධරයන්ගේ නම් හා තනතුරු :- ...................................................................................

13. පවත්නා ප්‍රතිපාදන යටතේ මෙම පහසුකම් සැපයිය හැකි ද යන වග :- ....................................................

14. වෙනත් විශේෂ කරුණු :- ...................................................................................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර අදාළ නිලධරයාට අංක .............. දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ................. ඡේදය යටතේ රජයේ වාහනයක් පාවිච්චි කිරීමට අවසර දීම නිර්දේශ කරමි.

ලේකම්

දිනය :- ……..…………................................... අමාත්‍යාංශය

(අත්සන සහ නිල මුද්‍රාව)

ඇමුණුම 02

**කාණ්ඩ I :** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2014 යටතේ තීරුබදු සහන සහිත මෝටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සහ විශ්‍රාම ගන්වනු ලබන පහත සඳහන් නිලධරයන්.

I. අග්‍රවිනිශ්චයකාරවරයා
II. නීතිපතිවරයා
III. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු
IV. අභියාචනාධිකරණයේ සභාපතිවරයා
V. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු
VI. ජනාධිපති ලේකම්
VII. අග්‍රාමාත්‍ය ලේකම්
VIII. අමාත්‍ය මණ්ඩල ලේකම්
IX. කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශයක ලේකම්
X. ජනාධිපති කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී
XI. පළාත් ප්‍රධාන ලේකම්
XII. විගණකාධිපති
XIII. මැතිවරණ කොමසාරිස්
XIV. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
XV. යුද්ධ හමුදාපති
XVI. නාවික හමුදාපති
XVII. ගුවන් හමුදාපති

**කාණ්ඩ II :** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2014 යටතේ තීරුබදු සහන සහිත මෝටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, ඉහත අංක I කාණ්ඩයෙහි ඇතුළත් නොවන දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ඊට සමාන හා ඊට ඉහළ තනතුරු හොබවන පහත සඳහන් නිලධරයන්.

I. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
II. ජනාධිපති අතිරේක ලේකම්
III. පොලිස්පති
IV. අග්‍රාමාත්‍ය කාර්යාලයේ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්
V. කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශයක අතිරේක ලේකම්
VI. දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
VII. සොලිසිටර් ජනරාල්
VIII. මහාධිකරණයේ විනිශ්චයකාරවරු
IX. නීති කෙටුම්පත් සම්පාදක
X. කැබිනට්/ කැබිනට් නොවන අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක, දෙපාර්තමේන්තු ප්‍රධානී/ අධ්‍යක්ෂ ජනරාල්/ කොමසාරිස් ජනරාල්
XI. පාර්ලිමේන්තු සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවක අධ්‍යක්ෂ ජනරාල්/ ලේකම්
XII. දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ හෝ SL 03 - 2006 දරන වැටුප් පරිමාණය හිමි තනතුරු

**කාණ්ඩ III:** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2014 යටතේ තීරුබදු සහන සහිත මෝටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, ඉහත කාණ්ඩ අංක I හා II යටතේ ආවරණය නොවන අනෙකුත් සියලුම නිලධරයන්.

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2014 හි 06 ඡේදය යටතේ විශ්‍රාම යන අවස්ථාවේ තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත

**( අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.)**

01. (I) මුලකුරු සමග නම :- ..............................................................................

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම :- ..............................................................................

02. (I) උපන්දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

(II) ජාතික හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

03. (I) පෞද්ගලික ලිපිනය :- ..............................................................................
..............................................................................
..............................................................................

(II) දුරකථන අංක :-

නිවස :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ජංගම :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. විශ්‍රාම යන දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

05. විශ්‍රාම ගනු ලබන්නේ :-
(I) වෛකල්පික විශ්‍රාම ගැනීම මත [ ]
(II) අනිවාර්ය විශ්‍රාම ගැනීම මත [ ]
(III) වෙනත් හේතූන් මත නම් සඳහන් කරන්න
..............................................................................

06. විශ්‍රාම යන දිනට ලබමින් සිටි
I) වැටුප් කේත අංකය :- ..............................................
II) වැටුප් පරිමාණය :- රු. ......................................
III) වැටුප් පියවර :- රු. ......................................

07. තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඔබ සුදුසුකම් ලබන්නේ මෙම චක්‍රලේඛයේ 6 වගන්තියේ කුමන අනු වගන්තිය යටතේ ද යන්න :- ..................................................
..............................................................................................................................

**08. ඔබ සුදුසුකම් ලබන්නේ මෙම චක්‍රලේඛයේ 6 වගන්තියේ 6:2 උප වගන්තිය යටතේ නම්,**

(I) SL 1 - 2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් සහිත තනතුරකට පත් වූ දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(II) තනතුරු නාමය :- ……………………………………………………………

(III) එම තනතුරට පත්වූයේ :-

| | |
|---|---|
| ස්ථිරව | |
| වැඩ බැලීමේ පදනම මත | |
| රාජකාරී ඉටුකිරීමේ පදනම මත | |

(අදාල කොටුවේ "✓" සළකුණ යොදන්න)

(IV) ඉහත සඳහන් චක්‍රලේඛයේ 6 වගන්තියේ 6:2 හා 6:3 උප වගන්තිවලට අදාළව දරන ලද තනතුරු පිළිබඳ විස්තර :-

| තනතුරු නාමය | සිට | | | දක්වා | | | තනතුරට පත් කර ඇත්තේ ස්ථිරව/ වැඩ බැලීම සඳහා/ රාජකාරි ඉටු කිරීම සඳහා | සුදුසුකම් ලබන මුළු සේවා කාලය |
|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය | මාසය | දිනය | වර්ෂය | මාසය | දිනය | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව ( අවුරුදු) | | | | | | | | |

---

**09. ඔබ සුදුසුකම් ලබන්නේ මෙම චක්‍රලේඛයේ 6 වගන්තියේ 6:6 උප වගන්තිය යටතේ නම්,**
**(අදාළ කොටුවේ "✓" සළකුණ යොදන්න)**

(I) තනතුර :-

| | |
|---|---|
| රජයේ විශේෂඥ වෛද්‍ය | |
| රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය | |
| I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය | |
| I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය | |

(II) රජයේ වෛද්‍ය නිලධරයෙකු/ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස මුල් පත්වීම් දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(III) එකී තනතුරේ වසර 25ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය :- …………………..................

(IV) ඔබ සුදුසුකම් ලබන්නේ රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස නම්,

(අ) රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස පත්වීම් ලද දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(ආ) රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස වසර 03ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(V) ඔබ සුදුසුකම් ලබන්නේ I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු / I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස නම්,

(අ) I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු/ I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස පත්වීම් ලද දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(ආ) I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු / I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස වසර 10 ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරන ලද දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

---

**10. ඔබ සුදුසුකම් ලබන්නේ 6 වගන්තියේ 6:7 උප වගන්තිය යටතේ නම්,**

(අ) 6:7:1 හෝ 6:7:2 යටතේ ගැනෙන සේවයකට හෝ තනතුරකට පත් වූ දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(ආ) එම සේවයේ/ තනතුරේ වසර 25ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරන දිනය :-

| | | |
|---|---|---|
| | | |

(ඉ) SL 1 - 2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට පත් වූ දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

(ඊ) එකී I ශ්‍රේණියේ වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :-

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

11. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට පෙර වර්ෂ 05ක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් යටතේ හෝ භාණ්ඩාගාර චක්‍රලේඛයක් යටතේ හෝ වෙනත් විධිවිධානයක් යටතේ හෝ තීරුබදු අනුග්‍රහ සහිත වාහනයක් ආනයනය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-

I) අදාළ චක්‍රලේඛයේ අංකය :- ……………………………...…………......…………

II) ණයවර ලිපි විවෘත කළ දිනය හෝ දේශීයව මිල දී ගනු ලැබූ මෝටර් රථ සඳහා පළමු ගෙවීම සිදුකළ දිනය :- :- ........................................................................................

III) වාහනය ආනයනය කළ දිනය :- ……………………………......…………………….

IV) ලියාපදිංචි කළ දිනය :- …………………………………………………………

V) වාහනයේ ලියාපදිංචි අංකය :- ……………………………....…………………..

12. වාහන බලපත්‍රය ඉල්ලා සිටින්නේ ඇමුණුම 2 හි කුමන කාණ්ඩය යටතේ ද යන වග :- (පහත වගුවේ 4 වන තීරුවේ **"✓"** සළකුණ යොදන්න.)

| **නිලධර කාණ්ඩය** | **මි.ර.ගැ. වටිනාකම ( ඇ.එ.ජ. ඩොලර්)** | **මෝටර් රථයේ ඉන්ධන වර්ගය** | **අයදුම්කරුට අදාළ කාණ්ඩය** |
|---|---|---|---|
| I. | 30,000 | පෙට්‍රල් හෝ ඩීසල් | |
| II. | 27,500 | පෙට්‍රල් හෝ ඩීසල් | |
| III. | 25,000 | පෙට්‍රල් හෝ ඩීසල් | |

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාම හේතුකොට ගෙන ජීවිත කාලය තුළ එක් වරක් පමණක් ලැබෙන තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රය ලබා ගැනීමට, ඉහත සඳහන් චක්‍රලේඛයේ කොන්දේසි අනුව මම කැමති බව දන්වමි. මගේ දැනීමේ හැටියට ඉහත මවිසින් සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. එම තොරතුරුවල වෙනසක් සිදු වුවහොත් නොපමාව ඒ බව දන්වා එවීමට පොරොන්දු වෙමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය වුවහොත් ගෙන්වා ගනු ලබන වාහනයට අදාළව සහන ලබා දෙන ලද තීරුබදු මගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කරන බව ද මම දනිමි.

දිනය: -.....................................

.........................................................

අයදුම්කරුගේ අත්සන

මගේ අංකය :-
දිනය:-

ලේකම්,

.......................................................................................... අමාත්‍යාංශය

මෙම කාර්යාලයේ තිබෙන නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බව සහතික කරන අතර, පහත සඳහන් ලියකියවිලිවල පිටපත් මේ සමග එවමි.

| | **අදාළ වේ පිටපතක් අමුණා ඇත** | **අදාළ නොවේ** |
|---|---|---|
| 1. විශ්‍රාම ගැන්වීමේ ලිපිය | | |
| 2. සේවා කාලය වසර 25ක් ඇති බව සනාථ කෙරෙන මුල් පත්වීමේ ලිපිය | | |
| 3. සේවයේ/ තනතුරේ I පන්තියට පත්කිරීමේ ලිපිය | | |
| 4. විශේෂඥ වෛද්‍යවරයෙක්/ විශේෂඥ දන්ත වෛද්‍යවරයෙක් ලෙස පත්කිරීමේ ලිපිය | | |
| 5. භාණ්ඩාගාරය විසින් තනතුර අනුමත ලිපිය | | |
| 6. මියගිය නිලධරයෙකු වෙනුවෙන් නම් මරණ සහතිකය, විවාහ සහතිකය | | |
| 7. වෛද්‍ය සහතික මත විශ්‍රාම ගන්වා ඇති නිලධරයෙක් නම් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාව | | |

තීරුබද්දෙන් නිදහස් වාහන ආනයන බලපත්‍රයක්, මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව නිකුත් කිරීම නිර්දේශ කරමි.

.......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

.................................................................................................................................................................

මගේ අංකය :-
දිනය:-

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

අංක 16/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ඉහත සඳහන් නිලධරයාට තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

…………...............................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :- ........................................